# පොලිස් මාධ්‍ය කොට්ඨාසය
# பொலிஸ் ஊடகப் பிரிவு
# POLICE MEDIA DIVISION
14 වන මහල,සුහුරුපාය,බත්තරමුල්ල

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| දිනය Date | 2025.04.19 පැය 2240 | දුරකථන අංකය Tel.NO | 011-2887973 | මගේ අංකය My NO | D/Media/Out/ 781 /2025 | විද්‍යුත් ලිපිනය E-Mails | dir.media@police.gov.lk |


**<u>පොලිස් මාධ්‍ය කොට්ඨාසය වෙත වාතර්‍ා වූ වැදගත් තොරතුරු</u>**

## 01. සැකකටයුතු මරණයක් - මාවනැල්ල පොලිස් වසම.

2025.04.19 වන අද දින දහවල් කාලයේ මාවනැල්ල පොලිස් වසමේ මාලියද්ද ප්‍රදේශයේ වෙල් යායක් අසල කැළෑබද ප්‍රදේශයක පුද්ගලයෙකුගේ මළ සිරුරක් ඇති බවට මාවනැල්ල පොලිස් ස්ථානයට ලද පණිවිඩයක් මත විමශර්න ආරම්භ කර ඇත.

**මරණකරු වයස අවුරුදු 61 ක් වූ මාකෙහෙල්වල ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

මරණයට හේතුව මෙතෙක් අනාවරණය වී නොමැත. මෘත ශරීරය සම්බන්ධයෙන් මහේස්ත්‍රාත් පරීක්ෂණය පවත්වා පශ්චාත් මරණ පරීක්ෂණය සඳහා මාවනැල්ල රෝහලේ මෘත ශරීරාගාරයේ තැන්පත් කර ඇති අතර මාවනැල්ල පොලිසිය වැඩිදුර විමශර්න සිදුකරනු ලබයි.

## 02. කඳු බෑවුමකින් වැටී පුද්ගලයෙකු මියයාම - පස්සර පොලිස් වසම.

2025.04.19 වන අද දින සවස් කාලයේ පස්සර පොලිස් වසමේ පාලාගොල්ල ප්‍රදේශයේදී පුද්ගලයෙකු කඳු බෑවුමකින් වැටී මියගොස් ඇති බවට පස්සර පොලිස් ස්ථානයට ලද පැමිණිල්ලක් මත විමශර්න ආරම්භ කර ඇත.

**මරණකරු වයස අවුරුදු 45 ක් වූ පාලාගොල්ල ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

මරණකරු 2025.04.18 වන දින නිවසේ පැවති සාදයකින් පසු පස්සර නගරයට යන බව පවසා නිවසින් ගොස් ඇති අතර නිවසට නොපැමිණීම හේතුවෙන් නිවැසියන් විසින් අද දින සොයා බැලීමේදී නිවසට ආසන්නයේ පිහිටි කඳු බෑවුමකින් පහල මෘත ශරීරය තිබී හමුවී ඇති බවට අනාවරණය වී ඇත.

මෘත ශරීරය සම්බන්ධයෙන් මහේස්ත්‍රාත් පරීක්ෂණය සිදු කිරීම සඳහා සිද්ධිය වූ ස්ථානයේ පොලිස් ආරක්ෂාව යටතේ ඇති අතර පස්සර පොලිසිය වැඩිදුර විමශර්න සිදු කරනු ලබයි.

## 03. හෙරොයින් සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - බස්නාහිර පළාත දකුණ අපරාධ කොට්ඨාසය.

2025.04.19 වන අද දින දහවල් කාලයේ කොහුවල පොලිස් වසමේ බෝධිය වත්ත ප්‍රදේශයේදී බස්නාහිර පළාත දකුණ අපරාධ කොට්ඨාසයේ නිලධාරීන් කණ්ඩායමක් විසින් ලද තොරතුරක් මත වැටලීමක් සිදුකර **හෙරොයින් ග්‍රෑම් 11 මිලිග්‍රෑම් 330 ක් සන්තකයේ තබා ගෙන සිටි සැකකරුවෙකු** අත්අඩංගුවට ගෙන ඇත.

**සැකකරු වයස අවුරුදු 24 ක් වන කළුබෝවිල ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

බස්නාහිර පළාත දකුණ අපරාධ කොට්ඨාසය වැඩිදුර විමශර්න සිදුකරනු ලබයි.

## 04. අයිස් මත්ද්‍රව්‍ය සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - වැල්ලම්පිටිය පොලිස් ස්ථානය.

2025.04.19 වන දින අළුයම් කාලයේ වැල්ලම්පිටිය පොලිස් වසමේ මීතොටමුල්ල හන්දිය අසලදී වැල්ලම්පිටිය පොලිස් ස්ථානයේ නිලධාරීන් කණ්ඩාමක් විසින් ලද තොරතුරක් මත වැටලීමක් සිදුකර **අයිස් මත්ද්‍රව්‍ය ග්‍රෑම් 10 මිලිග්‍රෑම් 350 ක් සන්තකයේ තබා ගෙන සිටි සැකකරුවෙකු** අත්අඩංගුවට ගෙන ඇත.

**සැකකරු වයස අවුරුදු 38 ක් වන කොළොන්නාව ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

වැල්ලම්පිටිය පොලිසිය වැඩිදුර විමශර්න සිදුකරනු ලබයි.

## 05. මාරක රිය අනතුරක් - වැලිකන්ද පොලිස් වසම.

2025.04.19 වන අද දින උදෑසන කාලයේ වැලිකන්ද පොලිස් වසමේ මරදන්කඩවල තිරක්කොන්ඩියාන්ඩුමඩු මාගර්යේ කඩවත්මඩුව ප්‍රදේශයේදී පොළොන්නරුව දෙස සිට මඩකලපුව දෙසට ධාවනය කල කැබ් රථයක් මාගර්ය අයිනේ ගමන් කල පදිකයෙකුගේ ගැටී අනතුරක් සිදුව ඇත. අනතුරින් තුවාල ලැබූ පදික පුද්ගලයා වැලිකන්ද රෝහලට ඇතුලත් කර ප්‍රතිකාර ලබමින් සිටියදී මියගොස් ඇත.

**මරණකරු වයස අවුරුදු 46 ක් වූ වැලිකන්ද ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

මෘත ශරීරය වැලිකන්ද රෝහලේ මෘත ශරීරාගාරයේ තැන්පත් කර ඇත. අනතුරට සම්බන්ධ කැබ් රථයේ රියදුරු අත්අඩංගුවට ගෙන ඇති අතර වැලිකන්ද පොලිසිය වැඩිදුර විමශර්න සිදු කරනු ලබයි.

## 06. මාරක රිය අනතුරක් - වාකරේ පොලිස් වසම.

2025.04.19 වන අද දින උදෑසන කාලයේ වාකරේ පොලිස් වසමේ මඩකලපුව ත්‍රිකුණාමලය මාගර්යේ පුල්ලාවේලි ප්‍රදේශයේදී මඩකලපුව දෙස සිට වාකරේ දෙසට ධාවනය කල යතුරුපැදියක් දකුණු පසට හැරවීමට යාමේදී ඊට පිටුපසින් එම දිශාවටම ධාවනය කල බස් රථයක ගැටී අනතුරක් සිදුව ඇත. අනතුරින් තුවාල ලැබූ යතුරුපැදිකරු වාලච්චේන රෝහලට ඇතුලත් කර ප්‍රතිකාර ලබමින් සිටියදී මියගොස් ඇත.

**මරණකරු වයස අවුරුදු 41 ක් වූ වාලච්චේන ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

මෘත ශරීරය වාලච්චේන රෝහලේ මෘත ශරීරාගාරයේ තැන්පත් කර ඇත. අනතුරට සම්බන්ධ බස් රථයේ රියදුරු අත්අඩංගුවට ගෙන ඇති අතර වාකරේ පොලිසිය වැඩිදුර විමශර්න සිදු කරනු ලබයි.

**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**